ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2015 ඔක්තෝබර් 06 වැනි දින** |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ 65 වැනි සාංවත්සරික දේශනය

ඉන්දියානු සංචිත බැංකුවෙහි අධිපති ආචාර්ය රගුරාම් ජී රාජන් මහතා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 65 වැනි සාංවත්සරික දේශනය කොළඹ “සිනමන් ලේක්සයිඩ්” හෝටල් පරිශ්‍රයේ දී 2015 ඔක්තෝබර් 05 වැනි දින පවත්වන ලදී. ආචාර්ය රාජන් විශිෂ්ට ශාස්ත්‍රඥයෙකු වන අතරම බැංකු කටයුතු, සාංගමික මූල්‍ය සහ ආර්ථික සංවර්ධනය, විශේෂයෙන්ම මූල්‍ය සම්පත්වල කාර්යභාරය යන විවිධ අංශ ඔස්සේ පර්යේෂණ සිදු කරනු ලබන කීර්තිමත් වෘත්තිකයෙකි. 2013 වසරේ දී ඉන්දීය සංචිත බැංකුවෙහි 23 වැනි අධිපතිවරයා ලෙස පත් කිරීමට පෙර ආචාර්ය රාජන්, චිකාගෝ විශ්වවිද්‍යාලයේ බූත් ව්‍යාපාර පාසලෙහි මූල්‍ය පිළිබඳ මහාචාර්යවරයා ලෙස ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ සහ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස ද, ඉන්දීය රජයෙහි මුදල් අමාත්‍යාංශයෙහි ප්‍රධාන ආර්ථික උපදේශක ලෙස ද සේවය කර ඇත. ඔහු, විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පොත්පත් ප්‍රකාශයට පත් කර ඇති අතර, එයින් ලුයිජි සින්ගේල්ස් සමඟ ප්‍රකාශයට පත් කරන ලද ‘Saving Capitalism from the Capitalists’ සහ 2010 වසරේ හොඳම කෘතිය ලෙස ‘Financial Times-Goldman Sachs’ ත්‍යාගයෙන් පිදුම් ලැබූ ‘Fault Lines: How Hidden Fractures Still Threaten the World Economy’ යන කෘති ආර්ථික චින්තනය පිළිබඳ නව මානයන් අන්තර්ගත කෘති ලෙස සැලකිය හැකිය.

එමෙන්ම, American Economic Review, Journal of Economic Perspectives, Journal of Political Economy, Journal of Financial Economics and Journal of Finance වැනි මූල්‍ය සහ ආර්ථික ක්ෂේත්‍රයට අදාළ ඉහළම ගණයේ සඟරාවල විවිධ ශාස්ත්‍රීය ලිපි පළ කොට ඇත. ආචාර්ය රාජන් ආර්ථික හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ ලොව ප්‍රධාන ශාස්ත්‍රඥයන් තිස් දෙනාගේ (Group of Thirty) කණ්ඩායමෙහි ද සාමාජිකයෙකි. ඔහු 2011 වර්ෂයේ ඇමෙරිකානු මූල්‍ය සංගමයේ සභාපති ලෙස කටයුතු කළ අතර, ඇමෙරිකානු කලා සහ විද්‍යා ඇකඩමියෙහි සාමාජිකයෙක් ද වේ. ආචාර්ය රාජන් 2013 වසරේ දී, වයස අවුරුදු හතළිහට අඩු විශිෂ්ටතම මූල්‍ය පර්යේෂක ලෙස ඇමෙරිකානු මූල්‍ය සංගමයෙහි සමාරම්භක 'Fischer Black' සම්මානයෙන් පිදුම් ලැබීය.

"ලෝක මූල්‍ය පද්ධතිය සහ තරග නීති" ('The Global Financial System and Rules of the Game') යන තේමාව ඔස්සේ සිය සාංවත්සරික දේශනය සිදු කළ ආචාර්ය රාජන්, කාලයත් සමඟ මහ බැංකුවේ කාර්යභාරය අතීතයට වඩා අප්‍රමාණ ලෙස පුළුල් වී ඇති බවත්, එය දැරිය නොහැකි තරම් බවට ඇතැම් අයට තර්ක කළ හැකි බවත් ප්‍රකාශ කළේය. ඒ අනුව, ආචාර්ය රාජන්ගේ දේශනය ලෝක ආර්ථික පරිසරය සහ වර්තමාන තත්ත්වයන් හමුවේ මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳව මතු සඳහන් කරුණුවලින් සමන්විත වූවකි.

ලොව ඇතැම් කලාපවල ඉහළ ආර්ථික වර්ධනයක් පැවතිය ද, කාර්මික රටවල් සහ නැගී එන ආර්ථිකයන්හි අභ්‍යන්තර වශයෙන් ඇති වන දේශපාලන පීඩනය කළමනාකරණය කර ගැනීම සඳහා ඉහළ වර්ධනයක් අත්‍යවශ්‍ය බැවින්, දැනට පවතින මන්දගාමී වර්ධනය අනතුරුදායක වේ. එවැනි අවිනිශ්චිත පරිසරයක් තුළ විවිධ රටවල වර්ධනය කෙරෙහි අධික පීඩනයක් එල්ල වන අතර, එවැනි රටවල් බොහෝවිට ආර්ථික වර්ධනය අලුතෙන් ඇති කර ගැනීමට වඩා අනෙකුත් රටවල් අනුසාරයෙන් වර්ධනයට මගපාදා ගැනීමට අවශ්‍ය කරන ප්‍රතිපත්ති කෙරෙහි යොමුවී ඇත.

අර්බුදයට පෙර, බොහෝ නැගීඑන වෙළඳපොළ ආර්ථිකයන් චීනයට අපනයනය සිදු කළ අතර, චීනය කාර්මික ලෝකය වෙත සිය අපනයන යොමු කරන ලදී. එසේ වුවද, කාර්මික රටවල ඉල්ලුම අස්ථිර පදනමක් මත ගොඩනැගී පැවතුණි. උදාහරණයක් වශයෙන් එක්සත් ජනපදයේ ඉල්ලුම පෞද්ගලික ණය මත පදනම් වූ අතර, ග්‍රීසියේ රාජ්‍ය

ණය මත පදනම් වූවා මෙන්ම, රටවල් විශාල සංඛ්‍යාවක් ඉතා පහළ පොලී අනුපාතික, අතිරික්ත වියදම් සහ ඉහළ ණය බරක් දැරීම මත ගොඩනැගී පැවති අතර එය ලෝක ආර්ථික අර්බුදයත් සමගම අවසන් විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, උකස් ණය අර්බුදය සමයේදී උචිත ප්‍රතිපත්ති සමගින් මැදිහත් වුවද, එකී අර්බුදය පසුව එක්සත් ජනපදයේ සිට යුරෝපීය කලාපය තුළ උග්‍ර අර්බුදයක් ලෙස ද, අවසානයේ නැගීඑන වෙළඳපොළ ආර්ථිකයන්හි අර්බුදයක් ලෙස ද පැතිරී ගියේය. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම වැනි සාම්ප්‍රදායික උපායමාර්ග එම රටවලට අර්බුදයෙන් ගැලවීමට ප්‍රමාණවත් නොවූ බව පැහැදිලිය. ඇත්ත වශයෙන්ම, එම රටවල් අර්බුදයෙන් ගලවා ගැනීමට අවශ්‍ය කරන හැකියාව එම සාම්ප්‍රදායික උපායමාර්ගවල නොපැවතිණ. යුරෝපය සහ ජපානය වැනි ඇතැම් ආර්ථිකයන් තුළ පැවති ඉහළ ණයගැති භාවය හේතුවෙන් රජයේ වියදම් සඳහා ප්‍රමාණවත් ඉඩක් නොපැවතුණි. විශාල සහ අතිශය ප්‍රබල අර්බුදයකට මුහුණ දෙමින් සිටීම නිසා පෞද්ගලික අංශය ද වියදම් කිරීමෙන් වැළකුණ අතර, මෙවැනි තත්ත්වයක් තුළ, බලපෑම සමනය කිරීම සඳහා රජය විසින් අතිවිශාල වියදමක් සිදු කළ යුතුව පැවතුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිවල ශක්‍යතාව සහ උචිත බව පිළිබඳව අධ්‍යනය කිරීම සහ නිරීක්ෂණයෙහි අවශ්‍යතාව වැනි කරුණු හේතුවෙන් රජයේ වියදම් ඉහළ නැංවීම ද ක්ෂණිකව කළ හැකි නොවේ. මේ අතරම, මුදල් අංශයෙහි දිරිගැන්වීම් ද ඇතැම් සීමාවන්ට යටත්ව පවතී.

කෙසේ වෙතත්, දැනට පවතින අඩු ඉල්ලුමට හා ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත්වීම ප්‍රමාද වීමට මූලික හේතුව ඇතැම් විට රාජ්‍ය මූල්‍ය හෝ මුදල් දිරිගැන්වීම හා සම්බන්ධ වූවක් නොවන අතර, එයට විසඳුම ඇත්තේ ගෝලීය ආර්ථිකය හා බැඳුණු සැබෑ ගැටලු විසඳීම තුළ වන බවට ද මෙහිදී අවධාරණය කෙරිණ. උදාහරණයක් ලෙස, අඩු පරිභෝජනයක් සහිත වැඩිහිටි ජනගහනය ඉහළ යෑම සහ පරිභෝජනය කෙරෙහි ආන්තික නැඹුරුව අඩු මට්ටමක පවතින ඉතා ධනවත් ජනතාවගේ ආදායම ඉහළ යෑම හේතුවෙන් කාර්මික රටවල ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල සහ කාර්මික රටවල ඉල්ලුම අඩු වීමත් සමඟ, අපනයන පදනම් වූ ක්‍රමෝපායයන් මත රැඳුණු දියුණු වෙමින් පවතින රටවල දේශීය පරිභෝජනය ඉහළ නැංවීම සඳහා නව ඉල්ලුම් මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වෙයි. මේ අතර, ඵලදායිතා මට්ටම කෙරෙහි විශාල බලපෑමක් ඇති කරන ආකාරයේ නවෝත්පාදන දක්නට නොලැබීම ද ගතික ලෝකයේ අඩු වර්ධනය කෙරෙහි හේතු වී ඇති බවට විකල්ප

පැහැදිලි කිරීමක් ලෙස දැක්විය හැකිය. විශේෂයෙන්ම, පශ්චාත් ලෝක යුද්ධ සමය තුළ නිෂ්පාදන සාධක ඵලදායිතා වර්ධනය 1920-50 කාලය තුළ පැවති ඉහළ මට්ටමට සාපේක්ෂව අඩු අගයක පැවතුණි. මෑත කාලීනව ඵලදායිතා වර්ධනය තවදුරටත් පහළ ගොස් ඇති අතර, අධ්‍යාපන හා ශ්‍රම සහභාගිත්ව මට්ටම වර්ධනය නොවීම හා ශ්‍රම බලකාය පහළ යෑම යන කරුණු හේතුවෙන් ආර්ථික වර්ධනයට තවදුරටත් අහිතකර බලපෑම් ඇතිකර ඇත.

මෙම තත්ත්වය තුළ, ආර්ථික වර්ධනයට ඇති විභවතාව ඉහළ නැංවීම හා අඩු ආර්ථික වර්ධනය සමනය කිරීම සඳහා තරගකාරිත්වය ඉහළ නැංවීම, නවෝත්පාදනය දිරිගැන්වීම හා ආයතනික වෙනස්කම් සිදු කිරීම මෙන්ම, ඵලදායිතාවය ඉහළ නංවන සුළු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇති කිරීම අවශ්‍ය වී ඇත. එවැනි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කෙටිකාලීනව දේශපාලනිකව බලපෑම් ඇති කරවන සුළු සහ වේදනාකාරී වුවත් දිගුකාලීනව ප්‍රතිඵල අත් කර දෙනු ඇත. එමගින්, රටවලට ලැබෙන වාසි පසුකාලීන මෙන්ම අවිනිශ්චිත වන අතර, එම හේතුවෙන් ඒ හා බැඳුණු දේශපාලනික ප්‍රතිවිපාක ද පවතිනු ඇත. උදාහරණයක් ලෙස, යුරෝ කලාපයේ අර්බුදයේ උච්චතම සමයේ දී එවකට ලක්සම්බර්ග්හි අගමැති ධූරය හෙබවූ ජීන් ක්ලෝඩ් ජන්කර් මහතා පැවසුවේ "අප සියලු දෙනා කළ යුතු දේ දන්නා වුවත්, අප නොදන්නා දේ නම්, එය සිදු කළ පසු නැවත බලයට පත්වන ආකාරයයි" ලෙසිනි. ඇතැම් රටවල් විශාල ව්‍යුහාත්මක වෙනස්කම් ක්‍රියාත්මක කර ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගෙන ඇතත්, බොහෝ රටවල් එවැනි වේදනාකාරී හැඩගැසීම් ක්‍රියාත්මක කිරීම කල්දමා ඇත.

ගෝලීය මූල්‍ය අර්බුදයට පෙර අවධියේදී, නැගීඑන රටවල් මෙන්ම කාර්මික රටවල ප්‍රාග්ධන ප්‍රවාහ සහ ඉල්ලුම අර්බුදයකට ලක්විය. නැගීඑන රටවල මහ බැංකු විසින් අනුගමනය කරන ලද විනිමය අනුපාතික මැදිහත්වීම් මෙන්ම, කාර්මික රටවල අධික ණය වර්ධනය ද ගෝලීය අර්බුදය සඳහා හේතු විය. කාර්මික රටවල් ඔවුන්ගේ පරිභෝජන අවශ්‍යතා වැඩි නොකර ආයෝජන අඩු කරනු ලැබූ අතර, එමගින් විදේශීය භාණ්ඩ සඳහා වන ඉල්ලුම මෙන්ම විදේශීය අරමුදල් මත රඳාපැවැත්ම ද අඩු විය. ඒ අනුව, සංවර්ධිත රටවල ජංගම ගිණුම්වල හිඟ තත්ත්වයක සිට අතිරික්ත තත්ත්වයක් දක්වා වෙනස් වීම, නැගීඑන රටවල ජංගම ගිණුම් අතිරික්ත සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය.

රජයේ සානුබල, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ අපනයන පෙරදැරි කරගත් උපායමාර්ග ආර්ථිකය වර්ධනය කිරීම සඳහා උපකාරී නොවිය හැකි හෙයින් අවසාන උපායමාර්ගය ලෙස මුදල් ප්‍රතිපත්තිය යොදාගත හැකිය. කාර්මික රටවල් පොලී අනුපාතික ශුන්‍ය මට්ටම දක්වා පහත හෙළනු ලැබූ අතර, එමගින් මූල්‍ය වත්කම්වල මිල ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය අංශයේ ප්‍රසාරණයක් සඳහා හේතු වූ අතර, එමගින් පරිභෝජන වියදම් සඳහා ද ධනාත්මකව බලපෑම් ඇති කෙරිණ. දෙවනුව, පොලී අනුපාතික පහත දැමීම සහ ප්‍රමාණාත්මක ලිහිල්කරණය සමඟ විනිමය අනුපාතික අවප්‍රමාණය වූ අතර, එමගින් අපනයන වෙළඳපොළ ශක්තිමත් විය. කෙසේ නමුත්, මෙමගින් නැගීඑන රටවල ආර්ථිකයන් සඳහා අහිතකර බලපෑම් ඇති කරනු ලබන හෙයින්, මෙම ක්‍රියාමාර්ගය සුදුසු උපායමාර්ගයක් ලෙස සැලකිය නොහැකිය.

අවසාන වශයෙන්, වත්මන් ආර්ථික පසුබෑම කාර්මික හෝ නැගීඑන රටක ගැටලුවක් නොවන අතර, මේ සඳහා සාමූහික ක්‍රියාමාර්ගයක් ගැනීම යෝග්‍ය වේ. ඒ අනුව, තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය තත්ත්ව රටවල් විසින් නිර්මාණය කරන අතර, ජාත්‍යන්තර සංවිධාන මගින් සියලු දෙනාටම යෝග්‍ය වන පරිදි නව නීති රාමුවක් බලාත්මක කිරීම යෝග්‍ය වේ. දීර්ඝකාලීන ප්‍රාග්ධනය සැපයිය හැකි, ශක්තිමත්, මනාව ප්‍රාග්ධනීකරණය වූ, නීත්‍යානුකූල බහුපාර්ශ්වික ආයතන සහ නව නීති රාමුව නිරීක්ෂණය කළ හැකි වෙනත් ආයතන ද මේ සඳහා අවශ්‍ය වේ. මේ අතර, සියලුම රටවල් නිදහස් වෙළඳාම්, විවෘත වෙළඳපොළ සහ ලෝක ආර්ථිකය තුළ වගකිය යුතු ලෙස ක්‍රියාකිරීම යන කරුණු සඳහා පොදු එකඟතාවයකට පැමිණීමට එක්ව කටයුතු කළ යුතුය. මෙම කරුණු සඳහා සියලුම රටවලට එකඟතාවයකට පැමිණිය හැකි නම්, ශක්තිමත් සහ තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගත හැකි වනු ඇත.

මෙම දේශනයෙහි සම්පූර්ණ ඉංග්‍රිසි පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි (www.cbsl.gov.lk) පළ කර ඇත.